# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,965 - 2016 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2016.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 816 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - නිඩා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම - 2016

ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.05.25 දින වේ.

බඳවා ගන්නා ශ්‍රේණිය : පේෂකර්ම උපදේශක III ශ්‍රේණිය

*වැටුප් පරිමාණය (මාසික)* : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 1 අනුව MN 1-2016-රු. 27,140-10x300-11x 350-10x 495-10x660-රු. 45,540/- වැටුප් පරිමාණය හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.

02. බඳවා ගැනීමේ පොදු *සුදුසුකම්* :

(අ) අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ආ) ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් සහ යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු අතර, සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන, ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් පදිංචිය සනාථ කළ යුතු ය.

(ඈ) මෙම තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය බවට මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඉ) *වයස* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

03. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම ;

*සහ*

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු පාඨමාලාව හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ආ) බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධි විධාන අනුව අදල මට්ටමේ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

* පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක ප්‍රමාණයක් බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

* පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විට්මත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට විවෘත තරඟ විභාගයක් නොපවත්වන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

06. *අයදුම් කළ යුතු පිළිවෙල*.- මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතු ය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවට ද අංක 05 සිට 08 දක්වා තොරතුරු දෙවන පිටුවට ද ඉතිරිය තෙවන පිටුවට ද ඇතුළත් වන සේ ඉල්ලුම්පත්‍රය තමන් විසින් ම සකස් කර ගත යුතු අතර, ඒ ඒ ශීර්ෂයන් පහත උපදෙස් අනුව පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

* ඔබ අයත් වන දිස්ත්‍රික්කය ''බදුල්ල'' ද ''මොණරාගල'' ද යන්න අයදුම්පත්‍රයේ A හි පැහැදිලිව සඳහන් කරන්න.

* ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය හා ඊට අදළ අංකය අයදුම්පත්‍රයේ B හි සඳහන් කළ යුතු ය.

* මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කළ යුතු ය.

උද. : PERERA A.B.C. (මෙහිදී Mr./Mrs./Miss යන වචන අතරින් අදළ නොවන වචන කපා හරින්න.)

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.05.25 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ''ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක තනතුර සඳහා බඳවා ගැනීම - 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

07. *අත්සන සහතික කිරීම :*

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 2,30,700 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08. *විභාග හා පරිපාලන වියදම් :*

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 400 කි. මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතු ය. ලදුපතේ මුල් පිටපත අයදුම් පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

09. තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10. විවෘත තරග විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, විභාගය සඳහා පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

12. *තරග විභාගයේ විෂය නිර්දේශය :*

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. අපේක්ෂකයාගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

*අභියෝග්‍යතාවය* : අපේක්ෂකයාගේ භාෂාමය හැකියාව හා සංඛ්‍යාමය හැකියාව මැන බැලීම සඳහා පවත්වන පරීක්ෂණයකි.

*සාමාන්‍ය දැනීම* : මෙම ප්‍රශ්න පත්‍රය සාමාජීය, ආර්ථික දේශපාලන තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය පූර්ව දැනුම් දීමකින් තොරව අවසන් කරනු ලැබේ.

14. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය. එමෙන්ම මෙම නිවේනයේ විධිවිධාන සලකා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බදුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම - 2016*

(කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි)

A. ඔබ අයත්වන දිස්ත්‍රික්කය : (බදුල්ල - 01/මොණරාගල - 02) ☐☐

B. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල - 01/දෙමළ - 02) ☐☐

01. 1.1 මුල'කුරු සමග නම : Mr./Mrs./Miss :..........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා.- PERERA A.B.C.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................
..........................................මහතා/මහත්මිය/මෙනෙවිය

02. 2.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................
..........................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................

2.3 දුරකථන අංකය :..........................................

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 ☐

3.2 උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2016.05.25 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04 4.1 2016.05.25 දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද ?..........................................

4.3 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................

4.4 පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................

05 අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා./පෙළ) විභාගය :

1. වර්ෂය :.......................................... 2. විභාග අංකය :..........................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

05. 5.2 අ.පො.ස. (උ./පෙළ) විභාගය :

1. වර්ෂය :.................................................. 2. විභාග අංකය :.............................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 *වෘත්තීය සුදුසුකම් :*

5.3.1 පාඨමාලාවේ නම :..................................................................
5.3.2 ලබාගත් ආයතනය :................................................................
5.3.3 සහතිකය වලංගු දිනය :..........................................................

06. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම්, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම හා ලිපිනය :.....
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................

07. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර :*

7.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..................................................................
7.2 ලදුපත් අංකය :...................................................................
7.3 ගෙවූ මුදල :...................................................................

ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

08. *අයදුම්කරුගේ සහතිකය :*

(i) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ii) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

09. අයදුම්කරුගේ *අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................................ලිපිනයේ පදිංචි ................................................මයා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය..............................දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..............................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :.................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.....................................................
තනතුර :.....................................................
ලිපිනය :.....................................................

10. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*
(දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

ඉහත තොරතුරු සඳහන් කර ඇති..................................................................................... මයා/මිය/මෙනවිය................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවද,........................... දින සිට ................................ තනතුරක සේවයේ යෙදී සිටින බවද, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බවද සහතික කරමි.

..............................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :.................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :.....................................................
තනතුර :.....................................................
ලිපිනය :.....................................................

04-1026/1

---

## ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2016

ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි III පන්තියේ II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.05.25 දින වේ.

බඳවා ගන්නා ශ්‍රේණිය - බදු නිලධාරි III පන්තියේ II ශ්‍රේණිය

වැටුප් පරිමාණය (මාසික) - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 5 - 2016 හි උපලේඛන අංක 1 අනුව
රු. 34,605-10x660-11x755-6x 240-15x 930-රු. 63,460 වැටුප් පරිමාණය හිමිය.
එකී චක්‍රලේඛයේ උපලේඛන අංක II අනුව මූලික වැටුප රු. 20,297 හා ගැලපුම් දීමනා රු. 9,767 හිමි ය.

02. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

*(අ)* අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* සෑම අපේක්ෂකයෙකුම ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් සහ විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඌව පළාත තුළ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු අතර ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන, ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.

*(ඈ)* මෙම තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය බවට මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*(ඉ)* *වයස* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

03. *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ)* පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු, හෝ
*(ආ)* වරලත් ගණකාධිකාරීන්ගේ මධ්‍යම පරීක්ෂණය, හෝ
*(ඇ)* ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය, හෝ
*(ඈ)* පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (අයි. සී. එම්. ඒ - එක්සත් රාජධානිය) I, II හා III යන කොටස් හෝ/සහතික කළ හා ඒකාබද්ධ ගණකාධිකාරී සංගමයේ (ඒ. සී. සී. ඒ. එක්සත් රාජධානිය) I, II හා III කොටස් හෝ ඊට සමාන වෙනත් ගණකාධිකරණය පිළිබඳ සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

*(අ)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වසර 03 ක පරිවාස කාලයකට යටත්ය.
*(ආ)* පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම සඳහා වසර 03 අවසානයේ පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. එම යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට අපොහොසත්වන නිලධාරින්ගේ පත්වීම අවසන් කරනු ලැබේ.
*(ඇ)* බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුල කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
*(ඈ)* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛවල විධි විධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

05. *බඳවාගැනීමේ ක්‍රමය*.- පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට විවෘත තරඟ විභාගයක් නොපවත්වන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

06. *අයදුම් කළ යුතු පිළිවෙල*.- මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස්කර ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවටද අංක 05 සිට 08 දක්වා තොරතුරු දෙවන පිටුවට ද ඉතිරිය තෙවන පිටුවටද ඇතුළත් වන සේ ඉල්ලුම්පත්‍රය තමන් විසින්ම සකස් කර ගත යුතු අතර, ඒ ඒ ශීර්ෂයන් පහත උපදෙස් අනුව පැහැදිලිව තම අත් අකුරෙන් ම සම්පූර්ණ කළ යුතු ය. අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

* ඔබ අයත් වන දිස්ත්‍රික්කය ''බදුල්ල'' ද ''මොණරාගල'' ද යන්න අයදුම්පත්‍රයේ A හි පැහැදිලිව සඳහන් කරන්න.
* ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය හා ඊට අදාළ අංකය අයදුම්පත්‍රයේ B හි සඳහන් කළ යුතු ය.
* මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කළ යුතු ය.
* උදා. : PERERA A.B.C. (මෙහිදී Mr./Mrs./Miss යන වචන අතරින් අදාළ නොවන වචන කපා හරින්න.)

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.05.25 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්, ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ ''ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම- 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

07. *අත්සන සහතික කිරීම*.- අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන රු. 230,700 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08. *විභාග හා පරිපාලන වියදම්*.- විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 400 කි. මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය

අයදුම්පත්‍රයට අලවා එවිය යුතු ය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

09. තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10. තරඟ විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. තරඟ විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

12. *තරඟ විභාගයේ විෂය නිර්දේශය* :- මෙම විභාගය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වන අතර, ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුක්ත ය. පළමුවන කොටස වන බුද්ධි පරීක්ෂණය පළමු විනාඩි 30 ඇතුළත පිළිතුරු සපයා ආපසු භාරදිය යුතු ය. අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා වූ 2 වන කොටසට ඉතිරි පැයක කාලය තුලදී පිළිතුරු සැපයිය යුතු ය.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 1/2

13. *සාවද්‍ය තොරතුරු සැපයීම.*- මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය පූර්ව දැනුම් දීමකින් තොරව අවසන් කරනු ලැබේ.

14. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බදුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2016**

**Calling Application for Recruitment to the post of Tax Officer - Class II of Grade III of Uva Provincial Revenue Department - 2016**

(කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි.)

A. ඔබ අයත් වන දිස්ත්‍රික්කය :
(බදුල්ල - 01/මොණරාගල - 02)

B. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - 01/දෙමළ - 02/ඉංග්‍රීසි - 03)

01. 1.1 මුල'කුරු සමග නම : Mr./Mrs./Miss :................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...............................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :...............................................................
...............................................................

02. 2.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...............................................................
...............................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :...............................................................

2.3 දුරකථන අංකය :...............................................................

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :ස්ත්‍රී - 1 / පුරුෂ - 0 ☐

3.2 උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2016.05.25 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. 4.1 2016.05.25 දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද ?...............................................................

4.3 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...............................................................

4.4 පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය :...............................................................

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා./පෙළ) විභාගය :

1. වර්ෂය :............................................ 2. විභාග අංකය :............................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |
| | | | 9 | | |

5.2 අ.පො.ස. (උ./පෙළ) විභාගය :

1. වර්ෂය :............................................ 2. විභාග අංකය :............................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 ලබාගෙන ඇති උපාධිය/ඩිප්ලෝමාව හෝ ඊට සමාන ශණකාධිකරණයට අදාළ සුදුසුකම් ：

| *උපාධිය/ඩිප්ලෝමාව හෝ ඊට සමාන ශණකාධිකරණයට අදාළ සුදුසුකම්* | *ලබාගත් ආයතනය* | *වලංගු දිනය* | *හදාරා ඇති විෂයයන්* |
|---|---|---|---|
| | | | |

06. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම්, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම හා ලිපිනය ：.....
.......................................................................................................................................................................................
.......................................................................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර ：

7.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ：..................................................................
7.2 ලදුපත් අංකය ：..................................................................
7.3 ගෙවූ මුදල ：..................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

08. *අයදුම්කරුගේ සහතිකය ：*

(i) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ii) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ：.......................................

09. අයදුම්කරුගේ *අත්සන සහතික කිරීම ：*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................ලිපිනයේ පදිංචි ................................................මයා./මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය..............................දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..............................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය ：.................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ：.....................................................
තනතුර ：.....................................................
ලිපිනය ：.....................................................

10. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-*
(දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

ඉහත තොරතුරු සඳහන් කර ඇති..................................................................................මයා/මිය/මෙනවිය....................................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බව ද,............................ දින සිට ................................ තනතුරක සේවයේ යෙදී සිටින බව ද, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බව ද සහතික කරමි.

.............................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :.................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :.....................................................
තනතුර :.....................................................
ලිපිනය :.....................................................

04-1026/2

---

## ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක - II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.05.25 දින වේ.

| | | |
|---|---|---|
| තනතුරු නාමය | : | භාෂා පරිවර්තක - සිංහල/දෙමළ<br>භාෂා පරිවර්තක - සිංහල/ඉංග්‍රීසි |
| බඳවා ගන්නා ශ්‍රේණිය | : | II ශ්‍රේණිය |
| වැටුප් පරිමාණය (මාසික) | : | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 1 අනුව<br>MN6 -2016- රු. 36,585 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 65,440 වැටුප් පරිමාණය හිමි ය.<br>එහි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ. |

02. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

*(අ)* අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු අතර, ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන, ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් සම්මුඛ පරීක්ෂණයේ දී පදිංචිය සනාථ කළ යුතු ය.

*(ඈ)* මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය බවට මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*(ඉ)* වයස.- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

03. *අධ්‍යාපන සුදුසුකම් :*

3.1 සිංහල/දෙමළ භාෂා පරිවර්තනය සඳහා :

*(අ)* අ.පො.ස. (සා. පෙළ) විභාගය හෝ ඊට සමාන විභාගයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වී තිබීම,

*සහ*

*(ආ)* දෙවන භාෂාව (සිංහල/දෙමළ) විෂයට අ.පො.ස. (සා. පෙළ) විභාගය හෝ ඊට සමාන විභාගයකදී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම,

*සහ*

*(ඇ)* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂා විෂය සහිතව උපාධියක් ලබා තිබීම.

3.2 සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තනය සඳහා :

*(අ)* අ.පො.ස. (සා. පෙළ) විභාගය හෝ ඊට සමාන විභාගයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල ඇතුළු විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වී තිබීම,

*සහ*

*(ආ)* අ.පො.ස. (සා. පෙළ) විභාගය හෝ ඊට සමාන විභාගයකදී ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම,

*සහ*

*(ඇ)* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂා විෂය සහිතව උපාධියක් ලබා තිබීම.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

*(අ)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

*(ආ)* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ප්‍රකාරව නියමිත මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :- ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. සියලුම සුදුසුකම් සපුරා ඇති විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයගෙන් ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. තරග විභාගයේ විෂය නිර්දේශය පහත දැක්වේ.

5.1 *තරග විභාගයේ විෂය නිර්දේශය* :- ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *විෂය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|
| 1. භාෂා පරිවර්තනය පිළිබඳ හැකියාව මැන බැලීම | පැය 03 | 100 |
| 2. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 |
| 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 |
| 4. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 |
| 5. අවබෝධය සහ සාමාන්‍ය දැනීම | පැය 1 | 100 |

1. භාෂා පරිවර්තනය : කාර්යාලයේ ලියවිල්ලක් හෝ වර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උධෘතයක් ඇතුළු කාර්යාලයීය, විද්‍යාත්මක, නෛතික සහ තාක්ෂණික ලියවිලිවලින් ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින් ද උපුටා ගත් දුෂ්කර පාඨ කිහිපයක් පහත දැක්වෙන ආකාරවලින් එනම්, I හෝ II න් එක් ආකාරයකින් පරිවර්තනය කිරීම.

(i) සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට සහ දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට,
(ii) සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට හා ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට.

2. *ඉංග්‍රීසි භාෂාව* : රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන් හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

3. *සිංහල භාෂාව* : රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන් හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

4. *දෙමළ භාෂාව* : රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන් හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

***සටහන*** :- සිංහල /ඉංග්‍රීසි/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍රවලින් තමන් අයදුම්කරන තනතුරට අදාළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතු ය.

5. *අවබෝධය හා සාමාන්‍ය දැනීම* :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා තුනෙන්ම පිළියෙල කරනු ලබන අවබෝධය හා සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතු වේ.

අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදි ය.

***සටහන***.-
- පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතු ය.
- අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම අවලංගු කළ හැක.

06. *අයදුම් කළ යුතු පිළිවෙල* :

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන් ම සම්පූර්ණ කළ යුතු ය. අංක 01 සිට 05 දක්වා කොටස් පළමු පිටුවට ද ඉතිරිය දෙවන හා තෙවන පිටුවට ද ඇතුළත් වන සේ ඉල්ලුම්පත්‍රය තමන් විසින්ම සකස් කර ගත යුතු අතර, අයදුම්පතේ ලබා දී ඇති උපදෙස් අනුව ඒ ඒ ශීර්ෂයන් පහත උපදෙස් අනුව පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.05.25 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ''ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීම - 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

07. *අත්සන සහතික කිරීම* :

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 230,700 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08. *විභාග හා පරිපාලන වියදම්* :

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 400 කි. මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතු ය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතික පරීක්ෂා කිරීමකින් තොරව තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10. විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.-*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය පූර්ව දැනුම් දීමකින් තොරව අවසන් කරනු ලැබේ.

12. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලකා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

ආර්. එම්. ටී. හාතියල්දෙණිය,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බදුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ඌව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම - 2016

**Recruitment to the Post of Translator - Grade II in Uva Provincial Public Service**

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

01. අයදුම්කරන තනතුරු නාමය : [ | ]
1. භාෂා පරිවර්තක - සිංහල/දෙමළ
2. භාෂා පරිවර්තන - සිංහල/ඉංග්‍රීසි

(අදාළ කොටුව තුළ තනතුරු නාමය හා අංකය සඳහන් කරන්න.)

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :..................................................................................

2.1 අවබෝධය හා සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය [ | ]

2.2 අයදුම් කරන තනතුර අනුව භාෂා මාධ්‍ය දෙක (භාෂා මාධ්‍ය හා අංකය අදාළ කොටුව තුළ ලියන්න.) [ | ] [ | ]

1. සිංහල
2. දෙමළ
3. ඉංග්‍රීසි

03. 3.1 මුල්’කුරු සමග නම : Mr./Mrs./Miss :..................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා.- PERERA A.B.C.

3.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................................................

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................................................
..................................................................................මහතා/මහත්මිය/මෙනෙවිය

04. 4.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................................................
..................................................................................

4.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..................................................................................

4.3 දුරකථන අංකය : ......................................................................................

4.4 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : [ | ] 1 - බදුල්ල / 2 - මොණරාගල

4.5 2016.05.25 වැනි දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : අවු. : [ | | | ] මාස : [ | ] දින : [ | ]

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 [ ]

5.2 උපන් දිනය : අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

5.3 2016.05.25 වැනි දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

5.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1 උපාධිය පිළිබඳ විස්තර :

6.1.1 උපාධියේ නම :.............................................................
6.1.2 විශ්වවිද්‍යාලයේ නම :..................................................
6.1.3 උපාධිය වලංගු දිනය :...................................................
6.1.4 හැදෑරූ විෂයයන් :........................................................

6.2 අ.පො.ස. (සා./පෙළ) විභාගය :

1. වර්ෂය :......................................................... 2. විභාග අංකය :....................................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

6.3 ඉල්ලුම් කරන තනතුරට අනුව අ. පො. ස. (සා/පෙළ) විභාගයේ මව් භාෂාව/දෙවන භාෂාව පිළිබඳ විස්තර :

1. වර්ෂය :................................................... 2. විභාග අංකය :..............................................

| | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | මව් භාෂාව | | |
| 2 | දෙවන භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) | | |

6.4 අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉල්ලුම් කරන තනතුරට අදාළ දෙවන භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් නොමැති නම් ඊට සමාන හෝ උසස් සුදුසුකම පිළිබඳ විස්තර :

6.4.1 විෂය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :............................................................
6.4.2 පාඨමාලාවේ නම :............................................................
6.4.3 සහතිකය නිකුත් කළ ආයතනය :............................................................
6.4.4 සහතිකය වලංගු දිනය :............................................................

07. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර.-

7.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..................................................................
7.2 ලදුපත් අංකය :...................................................................
7.3 ගෙවූ මුදල :...................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

08. *අයදුම්කරුගේ සහතිකය :*

(i) .................................................................................................. වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ii) මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුර සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................................

09. අයදුම්කරුගේ *අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................................ලිපිනයේ පදිංචි ................................................මයා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය..............................දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..............................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :.................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :......................................................
තනතුර :......................................................
ලිපිනය :......................................................

10. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

(දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.)

ඉහත තොරතුරු සඳහන් කර ඇති.................................................................................... මයා/මිය/මෙනවිය.......................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවද,.......................................... දින සිට ................................ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවද, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුව හොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බවද නිර්දේශ කරමි.

..............................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :.................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :......................................................
තනතුර :......................................................
ලිපිනය :......................................................

04-1026/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.